# ඉන්දීය බුදුසමයේ පරිහානිය සඳහා බලපෑ හේතු සාධක පිළිබඳ විචාරශීලී විමසුමක්

විල්ගමුවේ පියනන්ද හිමි

## හැඳින්වීම

බුදුසමයේ උපන් තිඹිරි ගෙය වූ භාරත දේශයෙන් බුදුසමය ඉතා සීඝ්‍රයෙන් පරිහානියටත් අභාවයටත් පත්වීම සඳහා බලපෑ කරුණු කවරේ ද යන්න නූතනය වන විටත් උගතුන් අතර පවතින සංවාදශීලි කරුණක් බවට පත්ව තිබේ. බුදුන් වහන්සේ සතුව පැවති නායකත්ව පෞරුෂත්වය මෙන් ම තත් කාලීන පාලක ප්‍රජාව හා සිටුවරු ආදි සමාජ කණ්ඩායම්වලින් ලැබුණු අනුග්‍රහශීලි දායකත්වය නිසා ක්‍රි. පූ. හයවන සියවසේ දී බුදුසමය ඉතා සීඝ්‍රයෙන් භාරතයේ බොහෝ ප්‍රදේශවල ව්‍යාප්ත විය. සියවස් තුනක් පමණ භාරතයේ ප්‍රධාන ආගම ලෙසින් ඉදිරියට පැමිණි බුදුසමය ධර්මාශෝක අධිරාජයාගේ අවධියෙන් පසුව ක්‍රමාණුකූලව පරිහානිය කරා ගමන් කළ ආකාරයක් දැකගත හැකිය. ඇතැම් විද්වතුන් පෙන්වා දෙන ආකාරයට ඉන්දියාවේ බුදුසමයේ පරිහානිය සඳහා බලපෑ පළමු කරුණ වනුයේ අශෝක අධිරාජයා විසින් ගෙන ගිය අන්‍යාගමික සහනශීලි ප්‍රතිපත්තියයි.[1] මෙයට අමතරව බෞද්ධයන් තුළම පැවති අභ්‍යන්තරික දුර්වලතා, සංඝයා අතර පැවති භේද භින්නතා, පාලක ප්‍රජාවගෙන් එල්ල වූ පීඩණයන්, ආර්ථිකමය වශයෙන් බෞද්ධයන් බෙලහීන වීම, මධ්‍යකාලීන ඉන්දියාවේ පැවති නොයෙක් විශ්වාසයන් බුදුසමයට ඇතුළත් වීම, හින්දු හා බෞද්ධ දෙපක්ෂය අතර ආගමික විශ්වාස පදනම් කරගෙන ඇතිව තිබූ තරඟකාරිත්වය, මුස්ලිම් ආක්‍රමණිකයන් වෙතින්



එල්ල වූ පීඩණයන් වැනි කරුණු රැසක් ඉන්දීය බුදුසමයේ පරිහානිය සඳහා බලපෑ බව විද්වතුන්ගේ අදහස වී තිබේ. ඉන්දීය බුදුසමයේ පරිහානිය සඳහා බලපෑ කරුණු මේ ආකාරයෙන් විවිධ ස්වරූපයෙන් ගෙනහැර දැක්වෙන අතර මේ සඳහා බලපෑ තවත් කරුණු රැසක් ඇති බව පැරණි මූලාශ්‍ර පිරික්සීමෙන් පැහැදිලි වෙයි. ඉන්දීය බුදුසමයේ පරිහානිය සඳහා බලපෑ කරුණු තව දුරටත් සංවාදශීලව විමසමින් පැරණි මූලාශ්‍ර ඇසුරු කරගෙන ඒ සඳහා බලපෑ හේතු කවරේ ද යන්න විචාරශීලව අධ්‍යයනය කිරීම මෙතුළින් සිදු කෙරේ.

## සංඝ සාමග්‍රිය දෙදරායාම

භාරතීය බුදුසමයේ පරිහානියට බලපෑ ප්‍රධාන සාධකයක් ලෙස භික්ෂූන් අතර ඇති වූ නිකාය භේදය හැඳින්විය හැකිය. භික්ෂූන් නිකාය වශයෙන් බෙදී යාම බුදුසමයේ ව්‍යාප්තිය සඳහා හේතු වූ බව ඇතැම් වියතුන්ගේ මතයයි. එහෙත් සූක්ෂම ආකාරයෙන් බලන විට පසු කාලීනව වර්ධනය වී ගිය නිකාය භේදය බුදුදහමේ පරිහානිය විශයෙහි බලපෑවේය. නිකාය වශයෙන් භික්ෂු සංඝයා බෙදී යාම නිසා සංඝ සාමග්‍රිය නැති විය. මුල් කාලයේ ශාසනය තුළ නිකාය භේදය එතරම් තදින් බල නොපැවැත්වූවද පසු කාලීනව එහි වර්ධනයක් දැකගත හැකිය. මූලික බෞද්ධ සංකල්ප පවා තමන්ට රුචි අයුරින් විග්‍රහ කිරීමට ඇතැම් නිකායිනයන් ගත් ක්‍රියාමාර්ගයේ අවසන් ප්‍රතිඵලය වූයේ බුදුදහම හා සෙසු සමය දර්ශන අතර වූ වෙනස ඉවත්ව යෑමය. මේ නිසා බුදුදහම තවත් ආගමික කොටසක් ලෙස ග්‍රහණය කර ගැනීමට විචාරපූර්වක නොවූ ජනතාව පෙළඹුනහ.

සිව්වන ධර්ම සංගිතයෙන් පසු එළඹෙන බෞද්ධ ප්‍රබෝධය මධ්‍යයේ සර්වාස්තිවාදි නිකායිකයන්ගේ වර්ධනය දැකිය හැකිය. ක්‍රි.ව. පළමුවන සියවස ආරම්භයත් සමග ථෙරීය හා මහායාන වශයෙන් බුදුසසුන තුළ ප්‍රබල බෙදීමක් සිව්වන සංගීතියෙන් පසුව ඇති විය. මූලික බෞද්ධ ඉගැන්වීම්වලට වඩා කාලීන සමාජ අවශ්‍යතා කෙරෙහි අනුකූලතාවයක් මහායාන හා එයින් බෙදී ගිය අනුනිකායිනයෝ දැක්වූහ. ඔවුන් හඳුන්වා දුන් පුද පූජා

සහ සෙසු ආගමික ක්‍රියාකාරකම් සාමාන්‍ය ජනතාවගේ අභිරුචිවලට සීමා විය.

ක්‍රි.ව. හත්වන සියවස වන විට මූලික බෞද්ධ ඉගැන්වීම් ගුරුකොට ගත් හීනයානය භාරතයේ බොහෝ ප්‍රදේශ තුළ අතුරුදන් විය. නිර්මල බුද්ධ වචනය ගුරුකොටගත් එය බටහිර ඉන්දියාවේ ප්‍රදේශ කිහිපයක පමණක් පැතිර තිබූ බව හියුං සියෑං හිමියෝ සවකීය දේශාටන වාර්තාවන්හි සඳහන් කරති. එම සුප්‍රකට චීන දේශ ගවේශක භික්ෂුව ඉදිරිපත් කරන මෙම විස්තරයේ සාරාංශය වනුයේ බුදුසමය ඈත පෙරදිග දියුණු වෙමින් පැවැති නමුත් භාරතයෙහි එය පරිහානිය කරා ගමන් කරමින් පැවැති බවයි. මූලික බුද්ධ වචනය මත පදනම් වූ හීනයානය බොහෝ ප්‍රදේශ වලින් අතුරුදන් වීම භාරතීය බුදු සමයේ පරිහානිය ඉක්මන් වීමට ප්‍රබල හේතුවක් විය.

ලිංග පූජා ආදී ග්‍රාම්‍ය වූ නොදියුණු අදහස් ගුඪවාදී බෞද්ධ නිකායන් වන වජ්‍රයානයේ හා තන්ත්‍රයානයේ දක්නට ලැබේ. මුල් බුදුසමය අකුසල් ලෙස හැඳින් වූ මධ්‍යසාර පානය, සත්ව ඝාතනය පමණක් නොව මනුෂ්‍ය ඝාතනය පවා තාන්ත්‍රික පූජා වලදී සිදු කොට ඇත. ගුප්ත යුගයේ පශ්චාත් භාගය වන විට මුල් වජ්‍රයානික ඉගැන්වීම් තවත් ප්‍රසාරණය වී ගුඪ ජුගුප්සාජනක ස්වරූපයක් ගෙන ඇත. හින්දු සමයෙහි දක්නට ලැබෙන දූෂිත බිලි පූජා, යන්ත්‍ර මන්ත්‍ර, හදි හූනියම් ආදී පූජා විධීන් පවා එහි අනුමත කොට ඇත. පිරිහෙමින් පැවැති බෞද්ධ සංස්කෘතිය රැක ගැනීම සඳහා ඉදිරිපත් වූ නව ආගමික ප්‍රතිසංස්කරණ ලෙස ඇතැම් දෙනා මේවා හැඳින් වූවද මෙහි වැඩි වාසි අත්පත් කරගත්තේ හින්දු පූජක සමාජයය.[2] හින්දු දහම හා බුදුදහම අතර කිසිදු වෙනසක් නොමැති බව අවධාරණය කිරීමට වජ්‍රායනිකයන්ගේ මෙම ප්‍රතිසංස්කරණවාදී ඉගැන්විම් හින්දු පූජකයන් යොදා ගත් බව ද ඓතිහාසික ග්‍රන්ථ පිරික්සීමෙන් පැහැදිලිය. මෙම පසුබිම උගතුන් බුද්ධිමතුන් බුදුදහමින් දුරස් කරවීමට හේතු වූ අතර විචාරශිලි නොවූ සාමාන්‍ය ජනතාවට ද බුදුදහම හා හින්දු ආගම අතර වූ වෙනස දර්ශනය කරගත නොහැකි විය.[3] මේ අනුව අභ්‍යන්තරික දුරුවලතාවක් වූ සම්බුද්ධ



පරිනිර්වාණයෙන් පසු ශ්‍රාවකයන් වහන්සේලා අතර ඇති වූ භේද භින්නතා සහ නිකායික මතවාද හේතුකොට ගෙන බුදුසමය භාරතයෙහි පරිහානියට පත් වීමේ ආරම්භය සටහන් විය.[4]

## බෞද්ධ විරෝධි දේශපාලන ප්‍රතිපත්ති

බුදුරදුන් ධරමාන සමයේ විසූ බිම්බිසාර, කෝසල, උදේනි, චන්ඩපජ්ජෝත, ලිච්ඡවි, මල්ල වැනි රජවරු බුදුසමය කෙරෙහි දැක්වූ දේශපාලන අනුග්‍රහය එහි ව්‍යාප්තිය සඳහා බෙහෙවින් උපකාරී විය. පසු කාලීනව ධර්මාශෝක හා කණිෂ්ක වැනි රජවරුන්ගේ ශාසනෝන්නතිකාමී ක්‍රියාමාර්ග එහි අඛන්ඩ වර්ධනය තවත් තීව්‍ර කළේය. එහෙත් ක්‍රි.පූ දෙවන ශතවර්ෂයේ සිට බුදුදහමට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය හීන විය. ඒ ධර්මාශෝක අධිරාජ්‍යයාගෙන් පසු සමස්ත භාරතය පුරා දේශපාලන බලය පැතිර වූ බෞද්ධ පාලකයෙකු පහළ නොවීම නිසාය. බුදුදහම විශයෙහි අනුග්‍රහය ලබා දීම කෙසේ වෙතත් රාජ්‍ය බලය යොදා ගනිමින් එය මර්දනය කිරීමට ඇතැම් භාරතීය පාලකයන් උත්සහ කළ ආකාරය ඉන් පසු වාර්තා වේ. ශුංග රාජ වංශික පුෂ්‍ය මිත්‍ර එහි ප්‍රමුඛයෙකු ලෙස හැඳින්විය හැකිය. හින්දු පූජක සමාජයේ අදහස් අවිචාරවත් ලෙස පිළිගත් ඔහු බුදුදහම මර්දනය කිරිමට උත්සුක විය. එමෙන්ම පළමුවන මහේන්ද්‍රවර්මන් රජු ශිව ආගම වැළඳ ගැනීම හේතුවෙන් බුදුදහමට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය අහිමි විය.[5] ක්‍රි.ව. 05 වන සියවස අගභාගයේ (ක්‍රි.ව.470-530) උත්තර භාරතයේ පාලනය කළ හත් වංශික රජවරු බුදුසමයට විරුද්ධව ක්‍රියා කළ පිරිසකි. ශිව භක්තිකයෙකු වූ මිහිරගුල නම් හත් පාලකයා උත්තර භාරතයේ වූ බෞද්ධ විහාරාරාම වනසා දැමීය.[6] සුප්‍රකට චීන දේශාටක හියුං සියෑං හිමියන් වාර්තා කරන පරිදි ක්‍රි.ව. 600 දී මධ්‍යම බෙංගාලය කේන්ද්‍ර කරගෙන රාජ්‍යත්වයට පත් වූ ශාශංක රජු බුදුසමයට එරෙහි කෘරතර ක්‍රියා අනුගමනය කොට ඇත. සිය පාලන ප්‍රදේශවල බුදුසමය මුලිනුපුටා දැමීමේ අරමුණෙන් කටයුතු කළ ඔහු ගයාවේ පිහිටා තිබූ ශ්‍රී මහා බෝධිය පවා විනාශ කළ බව සඳහන් වේ.[7]

එපමණකින් නතර නොවූ ශාශංක බුදුරදුන් පිරිනිවන් පෑ කුසිනාරාවෙහි වැඩසිටි භික්ෂූන් වහන්සේලා ඉන් පන්නා දමා එහි පිහිටුවා තිබූ බුදුරජුන්ගේ සිරි පතුල් ගල උගුල්වා ගංගානම් ගඟට දැමීය.[8] මෙම අවධියේම නූතන පංජාබයේ සිට බෙංගාලය දක්වා උත්තර භාරතයේ පාලන බලය හොබවූ හර්ෂවර්ධන රජු (ක්‍රි.ව. 606-648) බුදුසමය අනුග්‍රහය දැක්වූ බව සඳහන් වෙතත්, ඔහු ශිව ආගමටද අනුග්‍රහය දැක්වීමත් රාජ සභාවේ සිටි ඇතැම් බල සම්පන්න ඇමතිවරුන් ශිව ලබ්ධිකයන් වීම නිසාත් බුදුසමයට ලැබුණු දේශපාලන අනුග්‍රහය ද දුරවල විය. හර්ෂවර්ධනගේ ආගමික උත්සව පැවැත්වුණු කනෞජ්හි පැවැතියේ බෞද්ධ විහාරාරාම සීයකි. එහෙත් හින්දු දේවාල දෙසීයක් එහි ඉදිකොට ඇත. ක්‍රි.ව. 648 දී ඔහු මිය යන විට මහායාන ධර්මය වැළඳගෙන සිටි බව හියුං සියැං හිමිගේ වාර්තාවල සඳහන්ය.[9]

පසු කලෙක රජ කළ ලලිතාදිත්‍ය (ක්‍රි.ව.733-769) රජු ද මේපරිද්දෙන් බුදුදහමට යම් අනුග්‍රහයක් දක්වමින් විහාරාරාම ඉදිකළ නමුදු සෙසු ලබ්ධීන් සඳහා ද අනුග්‍රහය දක්වා ඇත. ඔහුගෙන් පසු පාලන බලයට පත් වූ අනුප්‍රාප්තික රජවරු හින්දු භක්තිකයෝ වූහ. ප්‍රථමයෙන් බෞද්ධයෙකු ලෙස සිට හින්දු ආගම වැළඳගත් කුමාරිළභට්ට (ක්‍රි.පූ.725-769) දක්ෂිණ භාරතීය බෞද්ධයන් සමූලඝාතනය කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දිමට කටයුතු කිරීම බුදුසමයේ අවනතියට හේතු විය. ඔහු කේරළයේ විසූ බෞද්ධයන් පන්නා දැමීමට කටයුතු කළ බව කේරළ උප්පත්ති කථාවේ සඳහන් වේ. ශංකර දිග්විජය නම් කෘතිය වාර්තා කරන අන්දමට ශාපයක් කොට බුදුදහම අතහැර හින්දු දහම වැළඳගත් කුමාරිලභට්ට නව ලබ්ධිකයෙකුගේ සැබෑ උද්‍යෝගිමත් බව ප්‍රදර්ශනය කරමින් බෞද්ධයන් සමූලඝාතනය කිරිමට සුධන්වන් නම් රජු පෙළඹවූ බව දැක්වේ.[10] ක්‍රි.ව. 09 වන ශත වර්ශයේ ගෝපාල, ධර්මපාල, දේවපාල, මහීපාල ආදී පාල වංශික රජවරුන්ගේ පාලනය යටතේ යම් පමණක අනුග්‍රහයක් බුදුසමයට හිමි වූ බව තාරානාථයෝ වාර්තා කරති. ඔවුහු බුදුසමයට හිතවත්ව කටයුතු කළද නැගී එමින් තිබූ හින්දු ආගමික බලවේගය මර්ධනය නොකිරීමට වගබලා ගත්හ. ඔවුන්



හින්දු දේවාලවලට පුද පඬුරු පිරිනැමූ බවත් පාල ඇමතිවරුන් බෞද්ධ විහාරස්ථානවල හින්දු හා වෙනත් සමයන්හි ප්‍රතිමා තැනවූ බවත් තරානාථයෝ වැඩිදුරටත් සඳහන් කරති.

මේ අනුව ක්‍රි.පූ. 03 වන ශත වර්ශයේ ධර්මාශෝක රජුගෙන් පසු ප්‍රබල රාජ්‍යානුග්‍රහයක් බුදු සමයට නොලැබීම එහි පරිහානිය ඉක්මන් කිරීමට සමත් විය. කණිෂ්ක, හර්ෂවර්ධන, පාල, ගුප්ත ආදී රාජ්‍ය වංශිකයන්ගෙන් ලැබුණු රාජ්‍ය අනුග්‍රහයද සීමිත ප්‍රදේශවලට පමණක් සිමා වූ අතර එය ඉන්දීය බුදුසමයේ නැගීම ඇති කිරීමට ප්‍රමාණවත් නොවීය.

## හින්දු සමයේ වර්ධනය

ක්‍රි.ව. 06 වන සියවසේ භාරතීය සමය සමාජයේ විද්‍යාමාන වූ ලක්ෂණයක් වූයේ බුදුසමය පරිහානිය කරා ගමන් කරමින් තිබීමත් හින්දු සමය අභිවර්ධනය වෙමින් තිබිමත්ය.[11] ලොව වෙනත් ඕනෑම ආගමක ඉගැන්වීම් ඉතා පහසුවෙන් හින්දු දර්ශනයට අන්තර්ග්‍රහනය කරගැනිමට ඇති හැකියාව හින්දු දහමට පමණක් ආවේණික ලක්ෂණයකි.[12] ඒ අනුව කරුණාව, මෛත්‍රිය, පරිත්‍යාගය, අවිහිංසාව වැනි සංකල්ප හින්දු ආගමට අන්තර්ග්‍රහණය කර ගැනීමත් සමග ඇතැම් බිලි පූජා හා යාගහෝමාදිය අභාවයට ගියේය. එපමණක් නොව එහි පැවැති දැඩි කුලවාදී ස්වරූපයද ලිහිල් විය. මෙසේ සෙසු ආගම්වල පැවැති ජනප්‍රිය ඉගැන්වීම් හා ලක්ෂණ එක්කර ගැනීම හින්දු සමයේ නව පුනර්ජීවයට බෙහෙවින් හේතු විය.[13] සිත් සේ වැඩුණු වනාන්තරයක් ලෙස හින්දු සමය හඳුන්වන චාල්ස් එලියට්ගේ ප්‍රකාශය මේ අදහස තවත් සනාථ කර දක්වයි. වෙනත් මතිමතාන්තර ඉවසන සුලු ගතියක් හෙබි හින්දු ආගම බාහිර ඇදහිලි හා අභිචාරවිධීන් ප්‍රතික්ෂේප කිරීම වෙනුවට ඒවා තමන් තුළට එක් රැස්කර ගැනීමේ සහජ පිළිවෙත සිය ඉතිහාසය මුළුල්ලේම අනුගමනය කර තිබේ.[14] කුලවාදය නිසා බ්‍රහ්මණ ආගමෙන් ඈත්ව සිටි ක්ෂත්‍රිය වංශිකයන් නැවත තමන් වෙත දිනා ගැනීමට හින්දු පූජකයෝ සංවිධානය වූයේ ක්‍රි.ව. ආරම්භයට

පෙර සිටය. ක්ෂත්‍රිය හා බ්‍රහ්මණ කුළ එක් තලයකට ගෙන ඒමට හඳුන්වාදුන් ක්ෂත්‍රිය- බ්‍රහ්මණ කුළය හින්දු ආගමේ නව ප්‍රතිසංස්කරණවාදි අදහසක් ඉදිරියට පැමිණීමක් සේ හඳුනාගත හැකිය.[15] මේ සමග ආගමේ ව්‍යාප්තිය උදෙසා දේශපාලන බලය යොදාගැනීම හින්දු පූජකයෝ පසුබට නොවූහ. ආගමික හා දේශපාලන සංස්ථා දෙකෙහිම බලාධිකාරය හින්දු පූජක සමාජයට ලැබීමත් සමඟ එය පෙරළා බුදු සමයට එරෙහිව යොදාගෙන ඇත.

විශේෂයෙන් බෞද්ධ හා ජෛන ආගම් වලට අනන්‍ය වූ ඉගැන්වීම් වන කර්මය, පුනර්භවය, විමුක්තිය, සත්‍ය, බ්‍රහ්මචර්යාව අවිහිංසාව ආදි සංකල්ප ක්‍රි.ව. 08 වන සියවසයෙන් පසු හින්දු සමයේ ද ප්‍රමුඛ ඉගැන්වීම් බවට පත්වීම එහි ව්‍යාප්තියට රුකුළක් විය. හින්දු දහමේ පශ්චාත් දාර්ශනික යුගයේ කැපීපෙනෙන දාර්ශනිකයකු වන කුමාරිලභට්ට හා ශංකර හඳුන්වා දුන් නව ප්‍රතිසංස්කරණවාදී අදහස් තව තවත් ජනප්‍රසාදය දිනා ගැනීමට හේතු විය. ප්‍රථමයෙන් බෞද්ධ භික්ෂුවක ලෙස සිට පසුව හින්දු ආගම වැළඳගත් කුමාරිලභට්ට (ක්‍රි.ව.725) මීමංසා ඉගැන්වීම් ප්‍රචාරය කළේය. පූර්ව මීමංසා දර්ශනය සඳහා ඔහු රචනා කළ තන්ත්‍රවර්තික අටුවාවේ දී බුදුසමය දැඩි ලෙස ගර්හාවට ලක් කර ඇති අතර ජීවිතයේ සාර්ථකත්වය සඳහා හින්දු වෛදික පූජාවිධීන්හි අවශ්‍යතාවය දැඩි ලෙස එහි අවධාරණය කොට ඇත.[16] ක්‍රි.ව. 09 වන සියවසයේ හින්දු ආගම ප්‍රචාරය කිරිමට උපන් අයකු ලෙස හැඳින්විය හැකි ශංකරාචාර්ය හඳුන්වා දුන් අද්වෛත වේදාන්ත දර්ශනය හින්දු සංස්කෘතියට නව ජීවයක් එක් කළේය.[17] මාධ්‍යමික හා විඥ්ඥාණවාදි බෞද්ධ ගුරු කුළ ඉදිරිපත් කළ තාර්කික විග්‍රහයන් හේතුවෙන් බුදුසමයේ සම්භාවනියත්වය වර්ධනය වීමත් සමග සම්ප්‍රදායික හින්දු සමය තුළ විද්‍යාමාන වූ පිරිහීම වළක්වා ගැනීමට ගෞඩපාද නම් හින්දු දාර්ශනිකයා බුදුසමයේ අදහස් හින්දු දහමට උකහා ගෙන එයට නව මුහුණුවරක් එක් කිරීමට ප්‍රයත්න දැරුවේ ශංකරාචාර්ය බිහි වීමට පෙර සිටය.



එහි උච්චතම අවස්ථාව අද්වෛත වේදාන්ත දර්ශනය තුළින් ශංකරාචාර්යවරයා සටහන් කළ අතර සංසාරය පිළිබඳව බෞද්ධ පිළිගැන්වීම් ඇතුලත් කොට මාධ්‍යමික හා විඥ්ඥාණවාදී දාර්ශනික ඉගැන්වීම් උකහා ගනිමින් ඔහු ඉදිරිපත් කළ අදහස් භාරතය පුරා ශීඝ්‍රයෙන් ප්‍රචාරය විය. විවිධ ප්‍රදේශයන්හි සංචාරය කරමින් බෞද්ධ භික්ෂුන් සමග වාද විවාද කරමින් හින්දු දර්ශනය ඔසවා තැබීමට යත්න දැරීය. වාද විවාද වලදී බෞද්ධ භක්ෂුන් නිරුත්තර කිරීමට ශංකරාචාර්ය සමත් විය. ජයග්‍රාහී හින්දු පක්ෂය වෙත බෞද්ධාගමිකයන් ඇදීයාම වළක්වා ගැනීමට සමත් බලවේලයක් බෞද්ධ සමාජයෙන් පැන නොනැගීම බුදුසමයට අවාසිසහගත විය. බුදුසමයේ අදහස් සිය දර්ශනයට අන්තර්ග්‍රහණය කර ගැනීම නිසා ශංකරාචාර්යවරයා ප්‍රච්ඡන්න බෞද්ධ යන නමින් පසුකාලීන විද්වත්හු හඳුන්වති. ඔහු බුදුසමය විවේචනය කළද නාගර්ජුනපාදයන් හා වසුබන්දුපාදයන් කිසිදු විටෙක විවේචනය කර නොමැති බව පෙන්වා දෙන ඇල්පිටියේ ඥානිස්සර හිමියෝ ශංකරාචාර්යගේ විවේචනයට පාත්‍ර ව ඇත්තේ ශක්ති සම්පන්න නොවූ සෞත්‍රාන්ත්‍රික හා සර්වාස්තිවාදීන් බව පෙන්වා දෙති.[18] ශංකරාචාර්යයෝ ස්වකීය කාර්යයන් වඩාත් ශක්තිමත් අයුරින් ඉදිරියට කරගෙන යාමට සමත් අනුගාමික ශිෂ්‍ය පිරිසක් ද ගොඩනැන්වූහ. හස්තමූලික, සම්තපානි, විශ්ණුගුප්ත, ශුද්ධ කීර්ති, පද්මපාද ආදීහු ඒ අතරින් කැපී පෙනන ශිෂ්‍යයෝ වෙති. ශංකරාචාර්යයන් හඳුන්වාදුන් අද්වෛතවාදී අදහස් නිසා භක්ති මාර්ගයට සීමා වි තිබූ හින්දු දර්ශනය ඥාන මාර්ගයට අයත් ආගමික චර්යාවන් ද එකතු වූ අතර එය තවදුරටත් හින්දු ආගම ජනකාන්ත වීම කෙරෙහි බලපෑවේ ය. මෙකී ආගමික සංදර්භය මධ්‍යයේ හින්දු පෙරහැර ආදියට බෞද්ධ භික්ෂූන් සහභාගීවීම සහ බෞද්ධයන්ගේ මංගල හා අවමංගල කටයුතු වලට බමුණු පූජකයන්ගේ ආධාර පැතීමට බෞද්ධ භික්ෂූන් කටයුතු කිරීම තුළ බුදුදහම ස්වාධීන ආගමික තත්වයෙන් ගිලිහෙන්නට විය. බුදුදහම හා හින්දු ආගම එකක් ලෙස සැලකීමට ආධානග්‍රාහීවත්යෙන් යුතු භාරතීය ජනයා පෙළඹීම තුළ සිදුවූයේ හින්දු ආගමේ ශාඛාවක් ලෙස බුදුදහම හඳුනාගැනීම ය. හින්දු පූජකයන්ගේ හා දාර්ශනිකයන්ගේ දෘඪතර

උත්සාහයේ අවසාන ප්‍රතිඵලය බුදුරදුන් පවා හින්දු දේව නාමාවලියට ඇතුලත් කර ගැනීමයි.[19]

හින්දු වෛෂ්ණවාදීන්ට අනුව විෂ්ණු දෙවියන් දස අවතාරයකින් ලෝකයා හමුවේ පෙනී සිටියි. දැනට අවසන් වරට ලොව පහළ වී ඇති නම වන අවතාරය වන්නේ ''බුද්ධ දේවය'' අධාර්මිකත්වයෙන් නොමඟ ගිය ලෝකවාසීන් සුමඟට හරවා ගැනීමේ අටියෙන් විෂ්ණු දෙවියන් බුදුරදුන් ලෙස සිටි බව එයින් කියවේ. බුදුරදුන් බුද්ධදේව ලෙස නම් කොට හින්දු ආගම තුළට අන්තර්ග්‍රහණය කර ගැනීම හින්දු දාර්ශනිකයන් යෙදූ සූක්ෂම උපක්‍රමයකි. එය බුදුසමය දියකර හින්දු ආගමේ කොටසක් බව කියාපෑමට ගත් උත්සාහයක් ලෙස ද හැඳිනගත හැකි ය. විෂ්ණුගේ දසවන අවතාරය ලෙස, මෙම භද්‍ර කල්පය අවසානයේ බුදුවන බවට බෞද්ධයන් විශ්වාස කරන මෛත්‍රී බුදුරදුන් ''කල්කන්'' ලෙසින් නම් කිරීම තුළින් ඔවුන්ගේ උපක්‍රමය තව දුරටත් පැහැදිළි වේ. බුදුදහම ඉන්දියාවෙන් තුරන්වීමට බලපෑ ප්‍රධාන හේතුව ලෙස ආචාර්ය රාධාක්‍රිෂ්ණන් මහතා පෙන්වා දෙන්නේ අවසානයේදී එය හින්දු සමය, වෛෂ්ණව සමය, ශිව සමය යනා දී වශයෙන් නැග ආ සෙසු සමය දර්ශනයන්ගෙන් වෙන් කොට හඳුනා ගත නොහැකි තත්වයට පත්වීම ය.[20]

## බෞද්ධයන් සතු ආර්ථික බලය පිරිහීම හා ප්‍රභූන්ගේ අනුග්‍රහය අහිමි වීම

බුදුරදුන් ධරමාන සමයේ බුදුසසුනේ ව්‍යාප්තිය උදෙසා ධනවත් සිටුවර පංතියෙන් හා ප්‍රභූ පංතියෙන් ලද නොමද අනුග්‍රහයන් හා පරිත්‍යාග ඉවහල් විය. බුද්ධකාලයේ විසූ අනාථපිණ්ඩික, ධනංජය, මෙණ්ඩක, පූර්ණවර්ධන, විශාඛා ආදීන්ගේ නම් එහි ඉහලින්ම සඳහන් වේ. වානිජ කටයුතු වලින් ලැබුණු අතිරික්ත ධනය බුදුසසුනේ අභිවෘද්ධිය සඳහා විහාරාරාම ඉදිකිරීමට හා භික්ෂු භික්ෂුණීන්ගේ ප්‍රත්‍යය පහසුව සඳහා වැය කළහ. එහෙත් ධාර්මික ඉපැයීම් මාර්ගයක් ලෙස බෞද්ධ ආර්ථික දර්ශනයෙන් දෙස්දෙන කෘෂිකර්මාන්තය කෙරෙහි පසුකාලීනව බහුතර බොදුනුවන් යොමු වූ බව භාරතීය සමාජ සංවිධානය



පරීක්ෂා කර බැලීමෙන් ප්‍රත්‍යක්ෂ වේ. එහෙයින් අතිරික්ත ධනයක් ඔවුන් අත නොරැඳීම ශාසනොන්නතිකාමී කටයුතුවලට බාධාවක් විය.

හින්දු සමාජයෙන් එල්ල වූ මර්ධනකාරී ප්‍රතිපත්තිය හමුවේ ජෛනාගමිකයන් නොසැලී සිටීමට හැකි වූයේ බහුතරයක් ජෛනයන් වාණිජ කටයුතුවලින් ලැබුණු ධනයෙන් සුරක්ෂිතව සිටීම නිසා ය.[21] රාජ්‍ය අනුග්‍රහය රහිතව පරිහානිය ලබමින් පැවති බුදුසමයට එවැනි අනුග්‍රහයක් නොලැබීම අවාසි සහගත වූ බව පෙනේ. ක්‍රි.ව ආරම්භයෙන් පසු බෞද්ධ සමාජය තුළ ශක්තිමත් වාණිජ පංතියක් බිහි නොවීම ශාසනයේ අවනතිය විෂයෙහි තදින් ම බලපෑවේ ය.

## මුස්ලිම් ආක්‍රමණිකයන්ගේ උමතු ආගමික ප්‍රතිපත්ති

අතීතයේ බෞද්ධ රාජ්‍යයන් ලෙස පැවති ඉන්දුනීසියාව, මැලේසියාව, ඇෆ්ගනිස්තානය හා මධ්‍ය ආසියාතික රටවල් රැසක් බුදුසමය මුලිනුපුටා දැමීමේ සාහසික අපරාධයට ඉස්ලාම් භක්තිකයන් වගකිවයුතු බව පැවසීම කිසිවකුගේ උදහසට කරුණක් නොවේ. එකී රටවල ඓතිහාසික තතු පරීක්ෂා කිරීමෙන් එය වඩාත් තහවුරු වේ.

ක්‍රි.ව. 712 සිට භාරතය ඉස්ලාම් වරුන්ගේ ආක්‍රමණවලට ලක් විය.[22] ගුජරාටය ඇතුළු ප්‍රදේශ රැසක් ඔවුන් යටත් කරගත් අතර එකී ආරම්භයම බෞද්ධ ආශ්‍රමයන්හි සමෘද්ධියට අහිතකර වූ බව සර් චාල්ස් එලියට් සඳහන් කරයි.[23] බිහාරය ලෙස වර්තමානයේ හඳුන්වන ප්‍රදේශයට ක්‍රි.ව 1193 දී කඩා වැදුණු **ඉක්තියාර්-උද්-දීන්මුහම්මද්** නැමැති මුස්ලිම් සෙනවියා එහි පිහිටා තිබූ සියලු විහාර අරාම සුණුවිසුණු කොට භික්ෂූන් සමූලඝාතනය කළේය. බුදුසමයේ දාර්ශනික පක්ෂය ඉලක්ක කර ගෙන හින්දූන් වාග් ප්‍රහාර එල්ල කරද්දී මුස්ලිම් වරුන්ගේ සමූලඝාතන ප්‍රහාර අඩපණ වෙමින් පැවති බුදුසමය තවත් දුර්වල තත්වයට ඇද දැමී ය. දාගැබ්, පිළිම, විනාශ කිරීම තමන් වෙත පැවරුණු ආගමික නියෝගයක් සේ සැලකූ ඔවුන් විසින් මාරාන්තික ප්‍රහාර බෞද්ධ

විහාරස්ථාන ඉලක්ක කොට එල්ල කරන ලදී. ආක්‍රමණික මුස්ලිම් අය අතින් බරණැස ඇතුළු වැදගත් බෞද්ධ සිද්ධස්ථාන රැසක් සමතලා විය. ක්‍රි.ව. 12 වන සියවසේ ආරම්භයේ සිට 13 වන සියවසේ අගභාගය දක්වා වේගවත් ප්‍රහාර එල්ල කළ ඔවුහු බුදුසමයේ ප්‍රබල සතුරන් බව යළි යළි සනාථ කළහ. ම්ලේච්ඡ අයුරින් භික්ෂූන් ඝාතනය කරමින් පෙති පිළිම බිඳ දමමින් සිදුකළ සංහාරය බලවත් විය. ගංගානම් නදිය ද තරණය කරමින් රට අභ්‍යන්තරයට පැමිණි මුස්ලිම් ආක්‍රමණිකයෝ ඒ වන විට කීර්තිමත් බෞද්ධ විශ්වවිද්‍යාල බවට පත් ව තිබූ නාලන්දා, වික්‍රමශීලා, ඕදන්තපුරි, ජගන්දලා, වලභි ආදී විද්‍යාස්ථානවලට කඩා පැන එහි විසූ උගත් භික්ෂූන් හා සිසුන් ඝාතනය කොට ආයතන ගිනිබත් කළහ. මෙකී සංහාරයට එරෙහිව නැගී සිටිය හැකි ගිහි පැවිදි බෞද්ධ නායකත්වයක් ප්‍රදර්ශනය නොවීම නිසා මුස්ලිම්වරුන්ට තම ආගමික ක්‍රියා රිසිසේ සිදුකර ගෙන යාමට හැකි විය. ආක්‍රමණික භක්තියාර් ඛිල්ජි නාලන්දා විශ්වවිද්‍යාලය විනාශ කිරීම[24] බුදුසමයේ ඉදිරි ගමනට පිරිමැසිය නොහැකි පාඩුවක් විය. වික්‍රමශීලා විශ්වවිද්‍යාලය ද නාලන්දාව සේ විනාශ කොට දැමීය. ජලන්දලාව ක්‍රි.ව 1207 දී විනාශ කරන ලදී.[25] ථෙරීය බෞද්ධ සම්ප්‍රදායේ කේන්ද්‍රීය විද්‍යස්ථානය වූ වලභි විශ්වවිද්‍යාලය ක්‍රි.ව. 13 වන සියවසේ මුල්භාගයේ මහමදිකයන්ගේ ප්‍රහාරවලට ලක්ව විනාශ විය. ඉහත සඳහන් උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන වනසා දැමීම ථෙරීය හා මහායාන බෞද්ධ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පමණක් නොව සමස්ථ බෞද්ධ සංස්කෘතියේම අවනතිට හේතු විය. ඉස්ලාමිකයන්ගේ ප්‍රහාරවලින් දිවි ගලවා ගැනීමට සමත් වූ භික්ෂූන් වහන්සේලා නේපාලය හා තිබ්බතය ආදී කඳුකර රාජ්‍යයන්ට පලා ගියහ. ගන්ධාරය, කාශ්මීරය, බිහාරය ඇතුලු ඉස්ලාම් බලපෑමට ලක් වූ ප්‍රදේශවල ඉතිරි වී සිටි බෞද්ධයන්ට සිය දිවි රැක ගැනීම සඳහා ඉස්ලාමයේ සරණයාමට සිදුවීම බෞද්ධ සභ්‍යත්වය මුළමනින් ම එම ප්‍රදේශවලින් අතුරුදන් වීමට හේතු විය.



## භික්ෂූන් සුඛෝපභෝගී ජීවියට හුරුවීම

බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සරල දිවි පැවැත්ම විනාශ වී යාමට බෞද්ධ ආරාම විෂයයෙහි රජුන්, ප්‍රභූන් හා පොදු ජනතාව විසින් පිදූ දේපළ ප්‍රබල හේතුවක් විය. මේ දේපළ භුක්ති විඳිමින් ජීවත් වූ භික්ෂු, භික්ෂුණීහු සුඛෝපභෝගී අලස ජීවිත ගත කරන පිරිසක් බවට පත් වූහ. ක්‍රි.ව. 07 වන සියවස වන විට බෞද්ධ ආරාම ධනවත් හා බලවත් ආයතන බවට පත්විය. නාලන්දාව ආදි ස්ථාන ගම් සිය ගණනකින් ආදායම් ලැබුණු විහාරාරාම ඓතිහාසික වාර්තාවල සඳහන්ය. එනිසාම භික්ෂු, භික්ෂුණී සමාජයේ නොයෙකුත් දූෂණ සිදු විය. මේ තත්ත්වය නිසා බුදුදහමේ ඉගැන් වූ සරල දිවි පැවැත්ම ආදර්ශයෙන් තොරවීමට පටන් ගත් හෙයින් පොදු ජනතාවගේ විශ්වාසය බුදුසසුන කෙරෙහි බිඳ වැටෙන්නට විය.

## බෞද්ධ ප්‍රතිමා වන්දනය

බුදුන් වහන්සෙගේ ප්‍රතිමා නිර්මාණය කොට උන්වහන්සේට දේවත්වය ආරෝපණය කිරීම බුද්ධාගම නව මගකට යොමු කිරීමට හේතු විය. ශංකරාචාර්ය වැනි හින්දු දාර්ශනිකයන් විසින් බුදුන් වහන්සේ විෂ්ණුගේ පුනරාවතාරයක් ලෙස දැක්වීම දූෂිත මහායාන හා තන්ත්‍රයාන විශ්වාසවලට හුරු පුරුදු ව සිටි බෞද්ධයන් විසින් පිළිගන්නා ලදී. ප්‍රතිමා වන්දනයෙන් හා නිරර්ථක පුද පූජා විධිවලින් තොරවීම ආදිය බුදුසමය පොදු ජනතාව අතර ඉක්මණින් ජනප්‍රිය වීමට හේතුවක් විය. මහායානිකයන් විසින් බුද්ධ හා බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය කිරීම, බෞද්ධ ඇඳහිලි, හින්දු දේව විශ්වාස හා සම්මිශ්‍රණ වීමට හේතුවක් විය. මෙම සම්මිශ්‍රණය නිසා සාමාන්‍ය ජනතාවට හින්දු ආගමක් බුද්ධාගමත් අතර වෙනස තෝරා බේරා ගැනීම අපහසු විය. බුද්ධාගමේ අන්‍යතාව විනාශ වී යාමට මෙය හේතුවක් විය. මේ තත්ත්වයෙන් ප්‍රයෝජන ගත් හින්දු උගතුන් බුද්ධාගම හින්දු ආගමේ ම තවත් නිකායක් ලෙස පොදු ජනතාවට අවබෝධ කර වූහ.

## සංස්කෘත භාෂාව භාවිත කිරීම

බුදුදහම ජනප්‍රිය වීමේ එක් හේතුවක් වූයේ බුදුන් වහන්සේ හා උන්වහන්සේගේ අනුගාමිකයන් පොදු ජනතාව අතර ව්‍යවහාරයෙහි පැවැති ප්‍රාකෘත වැනි භාෂා මගින් ධර්මය පහදා දීමයි. එහෙත් කණිෂ්ක අධිරාජ්‍යයාගේ කාලයේදී පැවැත් වූ 04 වන ධර්ම සංගායනාවෙන් පසු බෞද්ධ උගතුන් විසින් සංස්කෘත භාෂාව ආගමික භාෂාව වශයෙන් යොදා ගැනීම පොදු ජනතාව කෙරෙන් බෞද්ධ ඉගැන්වීම් දුරස්වීමට හේතු විය.

ඉහතින් සඳහන් කළ කරුණු අතරින් ඉන්දියාවේ පැවැති බුදුදහම පිරිහීමට ප්‍රධාන කරුණක් වූයේ මුස්ලිම් ආක්‍රමණ පෙන්වා දිය හැක. ඒ මන්ද යත් ඔවුන් ඉතා දරුණු හා මිලේච්ඡයන් ලෙස බෞද්ධ භික්ෂූන් හා බෞද්ධ වෙහෙර විහාර විශාල වශයෙන් විනාශ කිරීමයි. එසේම බෞද්ධයන් ඉස්ලාම් දහම වැලැඳ ගැනීම නිසාද බුදු දමහ ශිඝ්‍ර ලෙස ඉන්දියාව තුළින් අතුරුදහන්වීමට ප්‍රබල හේතුවක් විය.

## ආන්තික සටහන්

1. ශාසනරතන හිමි, මොරටුවේ, <u>ලක්දිව මහායාන අදහස්,</u> කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1962, 147 පිටුව.
2. විජේසිංහ, ඩබ්.ඒ.පී, <u>බෞද්ධ සංස්කෘතියේ භූගෝලීය ව්‍යාප්තිය</u> අංක 01, සමාධි කම්පියුටර් ග්‍රැෆික්ස්, වැලිවේරිය, 2004, 125 පිටුව.
3. බාප්ට්, පී.වී. සංස්., ගුණසේකර, පද්මා (පරි) <u>දෙදහස් පන්සිය වසරක බෞද්ධ සමය,</u> සූනෙර ප්‍රකාශකයෝ, නුගේගොඩ, 2016, 425-474 පිටු.
4. විජේරත්න, ආනන්ද, <u>ශ්‍රමන සම්ප්‍රදාය,</u> සමාධි කම්පියුටර් ග්‍රැෆික්, වැලිවේරිය. 2004, 29 පිටුව.
5. <u>එම</u>
6. එලියට්, චාල්ස්, <u>හින්දු සමය හා බුදුසමය,</u> අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේනතුව. 1967 105 පිටුව.
7. <u>එම</u>, 107 පිටුව.
8. විජේසිංහ, ඩබ්ලිව්.ඒ.පී., <u>බෞද්ධ සංස්කෘතියේ භූගෝලීය ව්‍යාප්තිය,</u> අංක 01 සංස්: සමාධි කම්පියුටර් ග්‍රැෆික්ස්, වැලිවේරිය, 2004, 111 පිටුව.



9. එලියට්, චාල්ස්, <u>හින්දු සමය හා බුදුසමය,</u> අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේනතුව, 1967, 119 පිටුව.
10. <u>එම</u> 121 පිටුව.
11. <u>එම</u>, 228 පටුව.
12. බෂාම්, එල්.එල්., <u>අසිරිමත් ඉන්දියාව,</u> අධ්‍යයන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1965, 386-389 පිටු.
13. විජේසිංහ, ඩබ්.ඒ.පී, <u>බෞද්ධ සංස්කෘතියේ භූගෝලීය ව්‍යාප්තිය</u> අංක 01, සමාධි කම්පියුටර් ග්‍රැෆික්ස්, වැලිවේරිය, 2004. 123 පිටුව.
14. මූර්ති, <u>ආගම හා මියගිය ලෝකය,</u> ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්, කොළඹ, 1962, 164 පිටුව.
15. ශාසනරතන හිමි, මොරටුවේ, <u>ලක්දිව මහායාන අදහස්,</u> ඇම්.ඩී ගුණසේන සහ සමාගම, 1962, 14 පිටුව.
16. එලියට්, චාල්ස්, <u>හින්දු සමය හා බුදුසමය,</u> අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේනතුව, 1967, 229 පිටුව.
17. මූර්ති, <u>ආගම හා මියගිය ලෝකය,</u> ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්, කොළඹ, 1962, 164 පිටුව.
18. ඤාණිස්සර හිමි, ඇල්පිටියේ, <u>භාරත දර්ශන,</u> එස්.ගොඩගේ සම සහෝදරයො. කොළඹ, 1990, 145 පිටුව.
19. විජේසිංහ, ඩබ්.ඒ.පී, <u>බෞද්ධ සංස්කෘතියේ භූගෝලීය ව්‍යාප්තිය</u> අංක 01 සංස්: සමාධි කම්පියුටර් ග්‍රැෆික්ස්, වැලිවේරිය., 2004, 123 පිටුව.
20. රාධක්‍රිෂ්ණන්, <u>ඉන්දීය දර්ශන ඉතිහාසය.</u>
21. Dutt.s, <u>Buddhist Monks and Monasterieteries in india</u>, london. 1962, 119 p.
22. එලියට්, චාල්ස්, <u>හින්දු සමය හා බුදුසමය,</u> අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේනතුව, 1967, 120 පිටුව.
23. <u>එම.</u>
24. රොලින්සන්, එච්.ජී., <u>භාරතීය සංස්කෘතික ඉතිහාසය.</u> අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්ථමේනතුව, 1967, 211 පිටුව.
25. විජේබණ්ඩාර, චන්දිම, මොරටුවගම, එච්.එම්., <u>බෞද්ධ ශිෂ්ටාචාරයේ මූලධර්ම හා වංශ කතාව,</u> ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2014, 231 පිටුව.